මූලාශ්‍රය: කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා
*ව්‍යාපෘති පිරිවැයද ඇතුළුව සංවර්ධන පිරිවැය
* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.

දෙවන පරිච්ඡේදය

2. ආයතනයේ මූලික කාර්යයන්

2.1 ආයතනය හා කාර්යභාර්ය

2.2 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵලපාදක කළමනාකරණ උපායමාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල

2.3 2021 – 2025 උපාය මාර්ගික සැලැස්ම

2.4 ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම

2.5 දීර්ඝ කාලීන සංවර්ධනයට දායකවන සේවක ක්‍රියාකාරකම්

2. ආයතනයේ මූලික කාර්යයන්

2.1 ආයතනය හා කාර්යභාරය

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ, 1977 පෙබරවාරි මස 01 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

අනතුරුව ප්‍රධාන ප්‍රඥප්තියට සංශෝධන එකතුකර 1991 අංක 36 දරණ පනත, 1997 අංක 21 දරණ පනත, 2003 අංක 34 දරණ පනත සහ 2006 අංක 42 දරණ පනත සම්මතකර තිබේ.

පරමාර්ථ

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, ඵලදායීතාවය වර්ධනය කිරීම, දළු අලෙවි කටයුතු සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභසිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථය වේ.

පනතට අනුව අධිකාරියේ කාර්යභාරය

1. කුඩා තේ වතුවල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතුවල ද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම.
2. එම තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම.
3. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්තශාලා වල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණුකිරීම හෝ අලෙවි කිරීම භාරගැනීම.
4. එකී ඉඩම් හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම සඳහා නැතහොත් එම පහසුකම් සහ සේවාවන් ලබාදීම පහසුකිරීම සඳහා ද, එම ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීමද ඇතුලත්ව ඔවුන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම.
5. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචිකර ඇති එවැනි සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සෑදීමට විධිවිධාන සැලසීම.
6. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.
7. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට භාර ගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැන ගැනීම.
8. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස්දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් අංක 2,3,4 හි කාර්යභාර්යන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනතින් ඉවත්කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පැවතුණි.

මීට අමතරව 1978 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වරින් වර පවරනලද කාර්යයන් සහ අනෙකුත් අදාළ පහත සඳහන් සෙසු කාර්යයන් ද ඇතුලත්වන පරිදි අධිකාරිය විසින් කටයුතු කරගෙන යන ලදී.

1. පෞද්ගලික අංශයේ කළමනාකාරිත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.
   a. තේ නැවත වගාව
   b. අලුත් වගාව
   c. පාළු සැපයීම
2. තේ පොහොර බෙදා හැරීම, වැවිලි ද්‍රව්‍ය, උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.
3. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

2.2 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵලපාදක කළමනාකරණ උපායමාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල


ව්‍යවස්ථාපිත අරමුණු ඉටුකිරීම පිණිස ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය ආයතනික උපායමාර්ගය වේ. ඒ යටතේ 2020 වසර සිට 2025 වසර දක්වා හඳුනාගත් මධ්‍යකාලීන ප්‍රතිඵල අරමුණුකර ගෙන වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් තුලින් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතුකර ඇත.
ඒ සඳහා ප්‍රධාන මිණුම් දණ්ඩ ලෙස කුඩා තේ වතු අංශයේ හෙක්ටයාරයක (නිමි තේ කිලෝ ග්‍රෑම්) ඵලදායීතාවය ප්‍රමුඛතම කාර්යඵල දර්ශකය ලෙස සලකා තිබේ. ඒ අනුව උස් බිම්, මැදිබිම් හා පහත් බිම් සාමාන්‍ය ඵලදායීතාවය සඳහා වාර්ෂික ඉලක්ක ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයට හඳුන්වා දීමෙන් ප්‍රතිඵල සාක්ෂාත්කර ගැනීමට ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවනු ලැබුණි. (2023 වසරට තේ හෝගය සඳහා හඳුනාගෙන ඇති ජාතික ඉලක්කය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 2,307 කි.) 2023 වර්ෂයේ කාර්යඵල සාර්ථකත්වය මැනීම සඳහා වූ ප්‍රධානම සංවර්ධන ඉලක්ක හා කාර්යඵල සාර්ථකත්වය පහත දක්වා ඇත. 2023 වසරේ ඵලදායීතාවය මැනීම සඳහා භාවිතාකර ඇත්තේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදිංචියට අනුව යාවත්කාලීන කරනලද ඉඩම් තොරතුරු වේ.

සංඛ්‍යා සටහන් අංක - 06
ආයතනයේ අපේක්ෂිත ඵලදායීතා ඉලක්ක හා කාර්ය සාධනය
හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් (වසරකට)

ප්‍රදේශය	2021			2022			2023		
	ඉලක්කය (කි.ග්‍රෑ)	කාර්යඵලය (කි.ග්‍රෑ)	%	ඉලක්කය (කි.ග්‍රෑ)	කාර්යඵලය (කි.ග්‍රෑ)	%	ඉලක්කය (කි.ග්‍රෑ)	කාර්යඵලය (කි.ග්‍රෑ)	%
පහත රට	2,500	1,316	53%	2,500	1,115	45%	2,500	1,117	45%
මැද රට	1,700	2,068	121%	1,700	1,773	104%	1,700	1,747	103%
උඩ	1,600	1,787	111%	1,600	1,540	96%	1,600	1,634	102%
සාමාන්‍යය	**2,307**	**1,414**	**61%**	**2,307**	**1,200**	**52%**	**2,307**	**1,205**	**52%**

* මූලාශ්‍රය: කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.
* 2023 වර්ෂයේ කාර්යඵලය ගණනය කරන ලද්දේ 2016 වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදංචියට අනුව. 2023 වර්ෂයේ යාවත්කාලීන කරන ලද තේ ඉඩම් ලියාපදිංචි තොරතුරු පදනම්කර ගෙනයි.

ප්‍රස්තාර සටහන් අංක 01
සාමාන්‍ය ඵලදායීතාවයේ වාර්ෂික ප්‍රවණතාවය
(වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම්)




* මූලාශය- 2005කුඩා තේ වතු ඉඩම් සංගණනය
* 2016වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදංචියට අනුව 2022/2023 යාවත්කාලීන කරන ලද තේ ඉඩම් ප්‍රමාණය පදනම්කර 2023 වසරේ තේ නිෂ්පාදනය 2023 වර්ෂයේද ඵලදායීතාවයව ගණනය කර ඇත.

2.2.1 සංවර්ධන සැලසුම්

1. වසර 03 ක දී වසරකට/ හෙක්ටයාරයකට/ සකස් කල තේ/ කිලෝ ග්‍රෑම්
   a. පහත රට 2,500 දක්වා
   b. මැද රට 1,700 දක්වා
   c. උඩ 1,600 දක්වා වැඩි කිරීම හා වාර්ෂිකව තේ ඉඩම්වලින් 10% ක ගේ තේ ඉඩම්වල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරවීම.
2. වසර 3 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 60 % දක්වා වර්ධනය කිරීම.
3. කුඩා තේ වතු සංවර්ධන සමිති 1,484 න් 25% ක්
4. "A" ශ්‍රේණියේ සමිති ලෙස ප්‍රජා මූල සංවර්ධනය කිරීම.
5. සියළුම සේවක ක්‍රියාකාරකම් ආයතනයේ දීර්ඝ කාලීන සංවර්ධනයට දායකවන ලෙස වෘත්තීය පුහුණු ක්‍රියාවලියක් ඇතිකිරීම.
6. තේ ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.

2.2.2. සංවර්ධන සැලසුම් ඉටුකර ගැනීමේ උපායමාර්ග



2.2.3 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ සංවර්ධන කාර්යයන්

ආයතනය ස්ථාපිත කිරීම සඳහා වූ පනතට පදනම්ව පැවති ප්‍රධාන ව්‍යවස්ථාපිත අරමුණු 4 ට අනතුරුව වර්ෂ 1997, 2003 හා 2006 යන වර්ෂවලදී පනතට එකතුකරන ලද සංශෝධන පරිදි ආයතනයෙහි ව්‍යවස්ථාපිත අරමුණු හා ඊට අදාළ සංවර්ධන කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර ඇත.

2.3 2021 - 2025 උපාය මාර්ගික සැලැස්ම

තිරසාර තේ කර්මාන්තයක් ඇති කිරීම සඳහා නිෂ්පාදන වියදම් අඩුකර ගැනීම, අවම ශ්‍රමයක් උපයෝගීකර කම්කරු අවශ්‍යතා සපුරා ගැනීම, පාරම්පරික ක්‍රමයෙන් බැහැරව අස්වැන්න නෙලාගැනීම, තේ නිෂ්පාදන ආන්තිකය ඉහළ දැමීම පදනම්කර වැවිලි අමාත්‍යාංශය විසින් 2020 වසරේ සකස් කල 2021-2025 පස් අවුරුදු සැලැස්ම අනුව තේමා 05 ක් ඔස්සේ තේ වතු හිමියන්ට උපදේශන සේවා හා අනෙකුත් සේවා සැපයීම අරමුණු කර උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කර ඇත.
ප්‍රධාන සංවර්ධන අරමුණු දෙකක් අරමුණුකර එම තේමා 05 ඉටුකර ගැනීමට පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස්කර ඇත.

වාර්ෂික නිමි තේ නිෂ්පාදනය 2025 වන විට කිලෝ මිලියන 360 දක්වා වැඩි කිරීම.

ආයතනයේ අපේක්ෂිත දිගුකාලීන සංවර්ධන ප්‍රතිඵලය "කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම " ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සකස්කල 2021-2025 පස් අවුරුදු සැලැස්මට අනුව දිගුකාලීන, කෙටිකාලීන හා මධ්‍යකාලීන උපායමාර්ග හඳුනාගෙන 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර එම ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතුකර ඇත.
ඉහත උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන මිණුම් දණ්ඩ ලෙස 2023 වර්ෂයේ කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය නිමි තේ කිලෝ ග්‍රෑම් මිලියන 245 ක් ලෙස හඳුනාගෙන ඇත. එහි ප්‍රගතිය වසර අවසන්වන විට කිලෝග්‍රෑම් මිලියන 190.662 වන අතර කාර්යඵල ප්‍රතිශත 78% කි. ජාතික නිෂ්පාදනය නිමි තේ කිලෝග්‍රෑම් මිලියන 335 ක් ලෙස හඳුනාගෙන ඇත. එහි ප්‍රගතිය වසර අවසන්වන විට කිලෝ ග්‍රෑම් මිලියන 256.039 ක් වන අතර කාර්යඵල ප්‍රතිශතය 76.4% කි. මෙහි විස්තරාත්මක තොරතුරු සංඛ්‍යා සටහන් අංක 07හි ඉදිරිපත්කර ඇත.

සංඛ්‍යා සටහන් අංක - 07
2020 - 2025 උපාය මාර්ගික සැලැස්මට අනුව තේ නිෂ්පාදන ඉලක්කය සහ ප්‍රගතිය

විස්තරය	2020	2021	2022	2023	2024	2025
ජාතික නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) ඉලක්කය	278	310	325	335	340	360
කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) ඉලක්කය	205	230	237	245	255	280
ජාතික නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) ප්‍රගතිය	278	299.34	251	256		
කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය ප්‍රගතිය (කිලෝ ග්‍රෑම් මිලියන)	205	223.2	189	190		
ප්‍රගතියේ ප්‍රතිශතය	**100%**	**97%**	**80%**	**78%**		

* මූලාශ්‍රය - වැවිලි අමාත්‍යාංශයේ 5 අවුරුදු උපාය මාර්ගික සැලැස්ම
* තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු

2.4 ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්

2023 ක්‍රියාත්මක සැලැස්ම පහත පරිදි වේ. ජාතික අවශ්‍යතාවය පරිදි වාර්ෂික තේ නැවත වගා අනුපාතය 2% ක මට්ටමින් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත 2023 වසර සඳහා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම රුපියල් මිලියන 750 ක් සඳහා පිළියෙලකර ඇත.

සංවර්ධන ක්‍රියාකාරකම්

තේ ඉඩම්වල ඵලදායීතාවය සුරක්ෂිත කිරීම හා එය අඛණ්ඩව පවත්වා ගැනීමට තේ නැවත වගාව, අලුත් වගාව, පාළු සිටුවීම් සඳහා රුපියල් මිලියන 281.07 ක්, එනම් සමස්ථ ප්‍රතිපාදන වෙන් කිරීම් වලින් 37.47% ක් වේ.

අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම්

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සේවකයන්ගේ හා සමිති නිලධාරීන්ගේ ඵලදායීතාවය වැඩිකිරීම හා කළමනාකරණය සඳහා රුපියල් මිලියන 8.07 ක් එනම් සමස්ථ වෙන්කිරීම් වලින් 1.07% ක් වෙන් කර තිබිණි.

ව්‍යාප්ති ක්‍රියාකාරකම්

තේ කර්මාන්තයට හඳුන්වාදෙන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, විශ්ලේෂණාත්මක ව්‍යාප්ති උපදේශන සේවා තේ ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා දැනුවත් කිරීම හා ප්‍රචාරණ කටයුතු සඳහා රුපියල් මිලියන 13.85 ක් එනම් සමස්ථ වෙන්කිරීම වලින් 1.85% ක් වෙන්කර තිබුණි.

ආයතනික ක්‍රියාකාරකම්

2023 ක්‍රියාත්මක සැලැස්මේ සංවර්ධන ප්‍රාග්ධන පිරිවැයෙන් ආයතනික කටයුතු ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 6.7 ක් එනම් සමස්ථ වෙන් කිරීම වලින් 0.89% ක් ඇස්තමේන්තුකර තිබුණි.

ආයතනික ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

කුඩා තේ වතු අංශය 2023 ක්‍රියාත්මක සැලැස්ම තුලින් අරමුණු කරනු ලැබූ සංවර්ධන ප්‍රතිඵල සාකෂාත් කර ගැනීමට අමතරව ආයතනික ප්‍රාග්ධන කටයුතු සඳහා 2023 වසර සඳහා සැකසූ ක්‍රියාත්මක සැලැස්මෙන් රුපියල් මිලියන 4 ක් වෙන් කර ඇති අතර එය සමස්ථ ප්‍රතිපාදනයෙන් 0.53% ක් වේ.


2.5 දීර්ඝ කාලීන සංවර්ධනයට, දායකවන සේවක ක්‍රියාකාරකම්


කාර්යමණ්ඩල පුරප්පාඩු වාර්ෂිකව 5% කට වඩා අවම මට්ටමින් පවත්වාගෙන යාම කෙටිකාලීන ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ අපේක්ෂාව වුවද, 2023 වසර අවසානය වන විට කාර්යමණ්ඩල පුරප්පාඩු ප්‍රතිශතය 10.9% ක් විය.

රාජකාරී කටයුතු සඳහා ආයතනික කාර්යමණ්ඩලයේ ධනාත්මක ආකල්ප ඇතිකර ගැනීමට ආයතනයේ විවිධ ශ්‍රේණීන් නියෝජනයවන ලෙස 2023 වසරේ දේශිය පුහුණු වැඩසටහන් 13 ක් සැලසුම්කල අතර 2023 වසරේ වැඩසටහන් 6 ක් පවත්වා ඇත. ආයතනයේ මාණ්ඩලික නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 02 ක් ද සියළුම සේවකයින් සඳහා මානව සම්පත් ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් ද කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා මනෝ විද්‍යාත්මක ආකල්ප සංවර්ධනය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් ද ප්‍රාථමික සේවකයින් සඳහා එක් පුහුණු වැඩසටහනක් ද පවත්වා ඇත.

තෙවන පරිච්ඡේදය

3. සංවර්ධන ක්‍රියාකාරකම්





3. සංවර්ධන ක්‍රියාකාරකම්

3.1 තේ නැවත වගාව

වසර 03ක දී වසරකට/හෙක්ටයාරයකට/සකස් කල තේ/කිලෝග්‍රෑම් පහත රට 2,500 දක්වා ද මැදරට 1,700 දක්වාද ඌව 1,600 දක්වාද වැඩි කිරීම


3.1.1 වාර්ෂිකව 2% මට්ටමින් තේ නැවත වගාව පවත්වා ගෙන යාම

කුඩා තේ ඉඩම්වල තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩිකිරීම පිණිස, අඩු අස්වනු සහිත පැරණි බීජ තේ ඉඩම්වල සහ වෙනත් හේතු මත නැවත වගා කිරීමට සිදුවන ඉඩම්වල අනුමත රිකිලි තේ නැවත වගා කරවීමට අනුබලදීම සඳහා තේ නැවත වගාව ක්‍රියාත්මක කෙරේ.

නැවත වගාවේදී දැරීමට සිදුවන අධික පිරිවැය සඳහා සහන සැලසීම පිණිස තේ නැවත වගාව සඳහා ලබාදෙනු ලැබූ සහනාධාර මුදල 2015 වසරේ සිට හෙක්ටයාරයකට රුපියල් 500,000/- දක්වා වැඩි කර තිබේ. එසේ වුවද වගා පිරිවැය අධිකවීම නිසා 2025 වසර දක්වා වූ පස් අවුරුදු සැලැස්මේ ජාතික තේ නිෂ්පාදන ඉලක්කය වන කිලෝග්‍රෑම් මිලියන 360 වන ඉලක්කයට යාමට 2015 වර්ෂයේදී වැඩිකල සහනාධාර මුදල ප්‍රමාණවත් නොවන බැවින් 2021 වර්ෂයේ හෙක්ටයාරයකට රුපියල් 630,000/- දක්වා සහනාධාර මුදල් වැඩි කරනලදි. මෙහි විස්තරාත්මක තොරතුරු ප්‍රස්තාර සටහන් අංක 02 හි දක්වා ඇත.

එයට අමතරව ඒ සඳහා තේ නැවත වගාවට ගොවීන් උනන්දු කරවීමට මුළු ඉඩම් අයිතිය පර්චස් 20 ත් අක්කර 1 ත් (අක්කරය ද ඇතුළුව) අතර රජයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථීර රැකියාවක් හෝ වෙනත් ස්ථීර ආදායම් මාර්ගයක් නොමැති කුඩා තේ වතු හිමියන්ට නැවත වගාවේ පැළ සිටුවීමෙන් පසු උපරිම අක්කර භාගයකට රුපියල් 5,000 ක් වන සේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයට සමානුපාතිකව මාසික දීමනාවක් මාස 24 ක් දක්වා කාලයකට ගෙවීම් සිදුකර ඇත.

ප්‍රස්තාර සටහන් අංක - 02




මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වගා සහනාධාර චක්‍රලේඛ අංක - 87 අනුව 2021 වර්ෂයේ වැඩි කර ඇත.

3.1.2 තේ නැවත වගාව සඳහා වාර්ෂිකව අයදුම් කිරීම

තේ නැවත වගා කිරීම සඳහා ගොවීන් 4,620 දෙනෙකුගෙන් අයදුම්පත් ලබාගැනීමට 2023 ක්‍රියාත්මක සැලැස්ම මඟින් ඉලක්ක කරනු ලැබීය.

ඒ අනුව ගොවීන් 1,873 ක් දෙනෙකු නැවත වගාව සඳහා අයදුම්කර තිබුණි. එම සංඛ්‍යාවෙන් 1,675 ක් සඳහා අවසරපත්‍ර නිකුත්කරනු ලැබිණි. මෙහි සවිස්තරාත්මක තොරතුරු ප්‍රස්තාර සටහන් අංක 03 මඟින් ඉදිරිපත්කර ඇත.

ප්‍රස්තාර සටහන් අංක - 03




මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා.

කාර්යඵලය


2022 වසරේ තේ නැවත වගාව සඳහා අවසරපත්‍රලාභීන් පැරණි තේ උදුරා දැමීමට අයදුම්කල හෙක්ටයාර ප්‍රමාණය 6,599 වන අතර එය 2023 දී 1,873 දක්වා ප්‍රමාණයක් අඩු වී ඇත. තේ නැවත වගාවේ වාරික 05ක් සඳහා රුපියල් මිලියන 234.69 ක් වෙන්කර තිබූ අතර රුපියල් මිලියන 382.223 ක් වසර අවසන්වනවිට ගෙවා තිබුණි. මෙහි ගෙවීම් විස්තර සංඛ්‍යා සටහන් අංක 08 මඟින් ද කාර්යඵලයට අදාළ විස්තර ප්‍රස්තාර සටහන් අංක 04 මඟින් දැක්වේ.

ප්‍රස්තාර සටහන් අංක - 04



මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ප්‍රස්තාර සටහන් අංක - 05



මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අවසාන ගිණුම්

සංඛ්‍යා සටහන් අංක - 08

තේ නැවත වගාව - 2022/2023 වර්ෂවල භෞතික කාර්යඵලය (හෙක්ටයාර)

අංකය	වගා කටයුත්ත	වර්ෂය	පහතරට බිම්					උඩරට හා මැදරට බිම්			එකතුව	වාර්ෂික ඉලක්කය	පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය
			ගාල්ල	කළුතර	මාතර	රත්නපුර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	ඌව			
1	ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව	2022	1,428	349	1,488	945	468	649	514	758	6,599	8,450	-43%
		2023	258	144	455	345	111	183	165	212	1,873	4,620	-72%
2	නිකුත් කල අවසරපත්‍ර සංඛ්‍යාව	2022	1,379	344	1,443	894	397	623	488	732	6,300	12,402	-45.1%
		2023	245	144	423	318	86	153	131	175	1,675	3,960	-73%
3	අවසරපත්‍ර වලින් ආවරණ බිම් ප්‍රමාණය	2022	375	136	398	321	188	230	168	206	2,022	2,100	-37%
		2023	77	59	113	131	30	62	41	35	548	330	-73%
4	බිම් සැකසීම	2022	199	66	200	203	79	76	56	81	960	860	-27%
		2023	46	12	116	64	22	33	20	24	337	330	-65%
5	පස පුනරුත්ථාපනය - I වාරිකය	2022	164	50	203	170	81	82	40	61	851	770	8%
		2023	68	32	115	58	40	36	20	41	410	400	-52%
6	පස පුනරුත්ථාපනය - II වාරිකය	2022	180	62	226	169	67	80	36	72	892	850	116%
		2023	112	39	133	88	59	68	24	51	574	450	-36%
7	තේ නැවත වගා කිරීම	2022	171	56	233	185	66	67	49	85	912	900	7%
		2023	90	30	127	54	36	47	20	17	421	362	-54%
8	වසරකට පසු නඩත්තුව	2022	145	77	127	168	52	75	42	62	748	800	-100%
		2023	82	33	160	72	40	34	30	20	471	240	-37%
9	ගෙවන ලද වගා ආධාර මුදල (රුපියල් මිලියන)	*2022	123.51	39.02	131.99	115.85	43.30	46.99	30.78	46.35	577.79	580.96	2.4%
		*2023	73.37	22.47	103.52	67.38	38.22	33.49	16.78	26.99	382.22	234.69	-34%

*2022 වර්ෂයේ තේ නැවත වගාව යටතේ බිම් සකස් කිරීම හා පස පුනරුත්තාපනය I අයවැය කථාව මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතීන් හි වියදම් ද ඇතුළත් වේ.
* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.
මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

සංඛ්‍යා සටහන් අංක - 09
තේ නැවත වගාව පිළිබඳ ක්‍රියාකාරීත්වය (1983 – 2023)

වර්ෂය	නිකුත් කළ අවසර පත්‍ර ගණන	අවසර පත්‍ර ආවරණ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	උදුරා දැමූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	වගාකළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	වාර්ෂික වියදම රුපියල් (මිලියන)	වාර්ෂික ප්‍රතිපාදන රුපියල් (මිලියන)
1983	1,758	826	454	379	11.2	11.5
1984	2,404	1,317	466	340	11.8	13
1985	1,160	823	615	414	16.4	8.1
1986	662	442	547	464	20.3	16.3
1987	630	390	346	349	14	22.8
1988	501	321	308	277	10.3	18.5
1989	758	455	246	330	18.9	17.4
1990	4,827	2,439	478	362	19.2	22.59
1991	3,109	1,423	581	304	20.49	33.91
1992	1,348	526	662	409	20.33	27
1993	3,699	1,147	507	516	29.79	32.24
1994	2,627	906	770	553	31.62	60.46
1995	3,465	1,267	1,390	533	38	41.75
1996	4,475	1,319	724	508	31.05	43.41
1997	6,235	1,580	923	435	40.32	68.91
1998	5,507	1,586	674	635	65.64	61.69
1999	3,660	955	861	767	88.82	77.95
2000	6,930	1,796	722	519	72.68	92.84
2001	7,093	1,952	841	574	77.76	98.85
2002	9,983	2,565	991	736	99.17	106.57
2003	11,928	2,892	1,179	765	122.82	150.11
2004	10,618	2,621	1,398	891	188.1	179.07
2005	9,291	2,127	1,306	1,058	174.83	182.13
2006	6,755	1,578	927	1,001	183.34	181.9
2007	5,274	1,030	1,008	1,024	172.89	214.75
2008	6,945	1,337	1,128	881	194.59	190.59
2009	6,493	1,610	925	777	178.17	190.17
2010	7,781	1,895	1,015	847	177.85	153
2011	8,033	2,170	947	772	187.64	156.26
2012	11,889	2,647	1,087	889	226.83	300.17
2013	13,802	2,928	1,188	1,165	351.87	236.75
2014	10,134	2,540	810	720	258.09	391.75
2015	9,006	2,278	1,173	806	420.07	464.69
2016	11,076	2,597	1,356	733	487.87	546
2017	12,945	3,053	899	748	460.59	466.1
2018	5,624	1,480	909	1,027	422.69	443.1
2019	3,308	2,751	376	639	298.31	303.72
2020	4,408	1,215	682	649	300.4	340.5
2021	11,478	3,306	1310	849	493.77	567.5
2022	6,300	2,022	960	912	*577.794	580.96
2023	1,675	548	337	422	*382.223	234.69

* 2022 වර්ෂයේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘතීන් හි වියදම ද ඇතුළත්ව ප්‍රගතිය දක්වා ඇත.
* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.
මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

සංඛ්‍යා සටහන් අංක - 10

උඩරට හා මැදරට තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව - 2023

(උදුරා දැමීමේ සිට දළු නෙලීමේ අවධිය දක්වා) හෙක්ටයාරයකට/රුපියල් දෛනික වැටුප රුපියල් 1,500.00

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකදම	උදුරා දැමීම පළමු වසර			පස පුනරුත්ථාපනය දෙවන වසර			තේ වගා කිරීම තෙවන වසර			පළමු වසර නඩත්තුව හතරවන වසර			දෙවන වසර නඩත්තුව පස්වන වසර			මුළු පිරිවැය			මුළු පිරිවැය ප්‍රතිශතය %
				ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	
1	පරණ තේ උදුරා දැමීම සහ ශුද්ධ කිරීම. (50% පැළ පැවති ඉඩමක දිනකට පවුරු 40 බැගින්)			132		198,000													**132**		**198,000**	**3.62**
2	මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම.			200		300,000													**200**		**300,000**	**5.49**
3	බෑවුම් සකස් කිරීම, කාණු දැමීම, පේලි සකස් කිරීම.			100		150,000	40		60,000	10		15,000	5		7,500	5		7,500	**160**		**240,000**	**4.39**
4	ඩොලමයිට් දැමීම (කි.ග්‍රෑ 1 ක් රු. 9.00 බැගින්)	3952	35,568	2	35,568	38,568													**2**	**35,568**	**38,568**	**0.71**
5	ගෝතමාලා පැළ කිරීම (රිකිලි 500 බැගින් දිනකට)			54		81,000													**54**		**81,000**	**1.48**
6	තෘණ සඳහා පොහොර දැමීම. (කි.ග්‍රෑ 1ක් රු.300.00 බැගින් කි.ග්‍රෑ. 989 කට)	1350	405,000	4	111,000	117,000	4	186,000	192,000	1	90,000	91,500							**9**	**387,000**	**400,500**	**7.32**
7	තෘණ කැපීම (වසරකට ශ්‍රම ඒකක 1 බැගින්)			14		21,000	56		84,000										**70**		**105,000**	**1.92**
8	වල් පැළ නෙලීම (වසරකට ශ්‍රම ඒකක 10 බැගින්)			30		45,000	20		30,000	100		150,000	120		180,000	120		180,000	**390**		**585,000**	**10.70**
9	සෙවන ගස් වගා කිරීම (ඇකේෂියා හා ඩැඩැල්ස් 750 ක් සඳහා රිකිලි 1 කට රු. 3.00 බැගින්) සහ ඩොලමයිට් කි.ග්‍රෑ. 370 ක් සඳහා රිකිලි 1 කට රු.3.00 බැගින්	750	5,580	6	5,580	14,580	1	242	1,742										**7**	**5,822**	**16,322**	**0.30**
10	උස් සෙවන වගා කිරීම. (ග්‍රැවිලියා 100 ක් රු. 55.00 බැගින් සහ ඩොලමයිට් කි.ග්‍රෑ, 100	100	7,723	4	7,723	13,723	1	108	1,608										**5**	**7,831**	**15,331**	**0.28**
11	තෘණ උදුරා දැමීම.									20		30,000							**20**		**30,000**	**0.55**
12	වලවල් හැරීම, ලණු ඇදීම, කුඤ්ඤ ගැසීම.									180		270,000							**180**		**270,000**	**4.94**
13	තේ වගා කිරීම (පැළයක් රු.35.00 බැගින්)	12500	437,500							60	437,500	527,500							**60**	**437,500**	**527,500**	**9.65**
14	සෙවන ගස් පාලනය කිරීම. (වසරකට දෙවර බැගින්)						6		9,000	12		18,000	15		22,500	15		22,500	**48**		**72,000**	**1.32**
15	බුබුළු අංගමාරය මර්ධනය කිරීම. (කොපර් ඔක්සයිඩ ග්‍රෑ. 280 - 420 ක්. වාර 1 රු. 3000.00)	3	24,000							40	24,000	24,000	40	24,000	24,000	40	14,000	14,000	**120**	**62,000**	**242,000**	**4.43**
16	දළු නෙලන තක්වයට තේ පවුරු හැඩ ගැස්වීම.												12		18,000	15		22,500	**27**		**40,500**	**0.74**
17	වසුන් යෙදීම.									100		150,000	75		112,500				**175**		**262,500**	**4.80**
18	තේ පොහොර යෙදීම. (වී. 200 තෙවන වසර)	1300	390,000							20	390,000	480,000	20	720,000	810,000				**40**	**1,110,000**	**1,170,000**	**21.40**
19	සිව්වන වසර	2500	750,000							60		90,000	60		90,000	32		48,000	**152**		**228,000**	**4.17**
20	වී. 750 පස්වන වසර	1800	540,000														525,000	585,000		**525,000**	**525,000**	**9.60**
21	පාළු සැපයුම්	2000	25										12	11,250	29,250	6	11,250	20,250	**18**	**22,500**	**49,500**	**0.91**
22	වටපණු උවදුර මර්ධනය කිරීම.(වෙලම් රසායනිකය පැලයකට මිලි ලීටර් 40 බැගින්		40,000							4	40,000	46,000							**4**	**40,000**	**46,000**	**0.84**
23	කෘමි උවදුරු මර්ධනය හා උපකරණ සඳහා (මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම)				5,000	5,000		5,000	5,000		5,000	5,000		5,000	5,000		5,000	5,000		**3,000**	**25,000**	**0.46**
	එකතුව			**546**	**164871**	**983871**	**128**	**191,350**	**383,350**	**607**	**986,500**	**1,897,000**	**359**	**760,250**	**1,298,750**	**233**	**555,250**	**904,750**	**1873**	**2,636,221**	**5,467,721**	**100**

පිරිවැය ඇස්තමේනතුව තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූල වන අතර අමුද්‍රව්‍ය පිරිවැය අන්තර්ගත කර ඇත.

Dolomite	**9000**	**9**
U 625	**300000**	**300**
T 750	**300000**	**300**
T 200	**300000**	**300**


සංඛ්‍යා සටහන් අංක -11 පහතරට තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව - 2023

(උදුරා දැමීමේ සිට දළු නෙලීමේ අවධිය දක්වා) හෙක්ටයාරයකට/රුපියල් දෛනික වැටුප රුපියල් 1,500.00

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	වියදම	උදුරා දැමීම පළමු වසර			පස පුනරුත්ථාපනය දෙවන වසර			තේ වගා කිරීම තෙවන වසර			පළමු වසර නඩත්තුව හතරවන වසර			දෙවන වසර නඩත්තුව පස්වන වසර			මුළු පිරිවැය			මුළු පිරිවැය ප්‍රතිශතය (%)
				ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	ශ්‍රම ඒකක	අමුද්‍රව්‍ය පිරිවැය	මුළු පිරිවැය	
1	පරණ තේ උදුරා දැමීම සහ ශුද්ධ කිරීම (50% පැළ පැවති ඉඩමක දිනකට පඳුරු 40 බැගින්)			104		156,000													104		156,000	2.96
2	මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම.			125		187,500													125		187,500	3.56
3	බෑවුම් සකස් කිරීම, කාණු දැමීම, පේලි සකස් කිරීම.			100		150,000	40		60,000	10		15,000	5		7,500	5		7,500	160		240,000	4.55
4	ඩොලමයිට් දැමීම (කි.ග්‍රෑ. 1 ක් සඳහා රු.9.00 බැගින්)	1976	17784	2	17,784	20,784													2	17,784	20,784	0.39
5	ගෝතමාලා පැළ කිරීම (රිකිලි 500 බැගින් දිනකට)			54		81,000													54		81,000	1.54
6	කෘණ සඳහා පොහොර දැමීම. (කි.ග්‍රෑ. 1 ක් රු. 300 බැගින් කි.ග්‍රෑ. 989 කට)	1610	483000	4	111,000	117,000	4	279,000	285,000	1	93,000	94,500							9	483,000	496,500	9.42
7	කෘණ කැපීම (වසරකට ශ්‍රම ඒකක 1 බැගින්)			14		21,000	56		84,000										70		105,000	1.99
8	වල් පැළ නෙලීම (වසරකට ශ්‍රම ඒකක 10 බැගින්)			30		45,000	20		30,000	100		150,000	120		180,000	120		180,000	390		585,000	11.10
9	සෙවන ගස් වගා කිරීම (ඇකේෂියා හා ඩැඩැප්ස් 100 ක් සඳහා) සහ ඩොලමයිට් කි.ග්‍රෑ. 150 ක් සඳහා රිකිලි 1 කට රු. 3.00 බැගින්)	300	4230	8	4,230	16,230	1	423	1,923										9	4,653	18,153	0.34
10	උස් සෙවන ගස් වගා කිරීම. (ග්‍රැවිලියා 100 ක් රු. 55.00 බැගින් සහ ඩොලමයිට් කි.ග්‍රෑ. 100)	100	7723	6	7,723	16,723	1	3,862	5,362										7	11,585	22,085	0.42
11	කෘණ උදුරා දැමීම.									20		30,000							20		30,000	0.57
12	වලවල් හැරීම, ලණු ඇදීම, කුඹස්සු ගැසීම.									180		270,000							180		270,000	5.12
13	තේ වගා කිරීම (පැළයක් රු. 35.00 බැගින්)	12500	437500							60	437,500	527,500							60	437,500	527,500	10.01
14	සෙවන ගස් පාලනය කිරීම. (වසරකට දෙවර බැගින්)						6		9,000	12		18,000	15		22,500	15		22,500	48		72,000	1.37
15	බුබුළු අංගමාරය මර්ධනය කිරීම. (කොපර් ඔක්සයිඩ් ග්‍රෑ. 280 - 420 ක්. වාර 1 රු. 3000.00)	4	12000							20	12,000	42,000	20	12,000	42,000	20	12,000	42,000	60	36,000	126,000	2.39
16	දළු නෙලන තත්වයට පත් කිරීම සුදුසු පරිදි හැඩගැස්වීම .												12		18,000	15		22,500	27		40,500	0.77
17	වසුන් යෙදීම.									100		150,000	75		112,500				175		262,500	4.98
18	තේ පොහොර යෙදීම.	1200	355000							20	355,000	385,000	20	724,000	754,000				40	1,079,000	1,139,000	21.61
	සිව්වන වසර	2430	724000							60		90,000	60		90,000	32		48,000	152		228,000	4.33
	ටී. 750 පස්වන වසර	1750	525000														525,000	525,000		525,000	525,000	9.96
19	පාළු සැපයුම්	2000	25										12	15,000	33,000	12	15,000	33,000	24	30,000	66,000	1.25
20	වටපණු උවදුර මර්ධනය කිරීම.(වෙලම් රසායනිකය පැලයකට මිලි ලීටර් 40 බැගින්	1	40000							4	40,000	46,000							4	40,000	46,000	0.87
21	කෘමී උවදුරු මර්ධනය කිරීම හා උපකරණ සඳහා (මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම)				5,000	5,000		5,000	5,000		5,000	5,000		5,000	5,000		5,000	5,000		25,000	25,000	0.47
එකතුව				**447**	**145,737**	**816,237**	**128**	**288,285**	**480,285**	**587**	**942,500**	**1,823,000**	**339**	**756,000**	**1,264,500**	**219**	**557,000**	**885,500**	**1720**	**2,689,522**	**5,269,522**	**100**

* පිරිවැය ඇස්තමේනතුව තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූල වන අතර අමුද්‍රව්‍ය පිරිවැය හා ප්‍රවාහන පිරිවැය ද අන්තර්ගත කර ඇත.

Dolomite	**9000**	**9**
U 625	**300000**	**300**
T 750	**300000**	**300**
T 200	**300000**	**300**




3.2 තේ අලුත් වගාව

ප්‍රතිපත්තිමය තීරණ මත 2003 වර්ෂයේ සිට අත්හිටවනු ලැබූ තේ අලුත් වගා ආධාර ක්‍රමය 2010 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව විකල්ප භෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශ සඳහා සීමිත ප්‍රතිපාදන යටතේ තේ අලුත් වගාව කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදී.

තේ අලුත් වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබූ උපරිම බිම් ප්‍රමාණය අක්කර 01 කි. 2015.0.101 දින සිට අලුත් වගා සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාර එකකට රුපියල් 400,000/- ක් දක්වා වැඩිකර තිබේ.

2021 වසරේ දී එම මුදල රුපියල් 500,000/- ක් දක්වා වැඩිකරන ලදි.

ප්‍රස්තාර සටහන් අංක - 06



මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා


කාර්යඵලය

2023 වසරේදී තේ අලුත් වගාව සඳහා අයදුම්පත්‍ර 312 ක් ලැබී තිබුණි. එහි ඉලක්කගත ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 588 කි. වසරේ ප්‍රතිපාදන සීමාව සැලකිල්ලට ගෙන 181 දෙනෙකු සඳහා අවසරපත්‍ර නිකුත් කරන ලදී.

හෙක්ටයාර 42 ක බිම් ප්‍රමාණයක් බිම් සැකසීම සඳහා 2023 වසරේ ඉලක්කකල අතර හෙක්ටයාර 43.9 ක බිම් සැකසීම නිමකර තිබුණි. එම ප්‍රමාණය ඉලක්කයට සාපේක්ෂව 104.5% ප්‍රගතියකි. 2023 වර්ෂයේ තේ අලුත් වගා ක්‍රමයේ වගාව වාරිකය සඳහා හෙක්ටයාර 42 ක් ඉලක්කකල අතර හෙක්ටයාර 47.02 ක් වගා කිරීමට හැකිවිය. එය ඉලක්කයට සාපේක්ෂව 111.9% ක වර්ධන ප්‍රගතියකි. 2023 වසරේ තේ අලුත් වගාව සඳහා ගෙවූ මුළු මුදල රුපියල් මිලියන 82.022 කි.


මෙහි ගෙවීම් විස්තර සංඛ්‍යා සටහන් අංක 12 මඟින් ද කාර්යඵලයට අදාළ විස්තර ප්‍රස්තාර සටහන් අංක 08 මඟින් ද දැක්වේ.

ප්‍රස්තාර සටහන් අංක - 07



මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

ප්‍රස්තාර සටහන් අංක - 08



මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා
2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා තේ අලුත් වගා සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක නොවුණි.

සංඛ්‍යා සටහන් අංක - 12

තේ අලුත් වගාව - 2022 / 2023 වර්ෂවල භෞතික කාර්යඵලය (හෙක්ටයාර)

අංකය	කාර්යය	වර්ෂය	පහතරට බිම්					උඩරට හා මැදරට බිම්			එකතුව	ඉලක්ක	පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය
			ගාල්ල	කළුතර	මාතර	රත්නපුර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	ඌව			
1	ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව	2022	612	420	440	431	901	239	193	396	**3632**	6901	49%
		2023	25	32	25	6	161	12	43	8	**312**	546	-91%
2	නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව	2022	607	421	433	393	654	217	185	302	**3212**	7186	55%
		2023	17	32	21	3	75	7	17	9	**181**	504	-94%
3	බිම් සැකසීම	2022	75	73	56	61	84	23	13	29	**414**	300	65%
		2023	9.80	9.50	9.50	4.20	6.50	3.70	0.33	0.05	**43.58**	42	-89%
4	වගාව	2022	75	73	56	61	84	83	13	23	**468**	300	66%
		2023	9.8	9.5	10.0	4.3	6.5	3.8	0.5	2.6	**47.01**	42	-90%
5	නඩත්තුව	2022	95	159	88	73	126	29	14	31	**615**	645	-32%
		2023	38	75	36	30	54	13	6	8	**260**	182	-58%
6	ගෙවන ලද ආධාර මුදල (රුපියල් මිලියන)	*2022	29.6	34.06	24.66	24.25	33.59	9.46	5.32	8.52	**169.5**	168.89	-40.73%
		*2023	16.99	15.40	12.69	12.70	12.32	5.69	1.14	5.09	**82.02**	23.38	-107%

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

*2022 වර්ෂයේ තේ අලුත් වගාව යටතේ බිම් සකස් කිරීම හා වගාව අයවැය කථාව මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතීන් හි වියදම් ද ඇතුළත් වේ.

* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.

සංඛ්‍යා සටහන් අංක - 13
තේ අලුත් වගාව පිළිබඳ ක්‍රියාකාරීත්වය 1982 - 2023

වර්ෂය	නිකුත් කළ අවසර පත්‍ර ගණන	අවසර පත්‍ර ආවරණ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	උදුරා දැමූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	වගාකළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	වාර්ෂික වියදම (රුපියල් මිලියන)	වාර්ෂික ප්‍රතිපාදන (රුපියල් මිලියන)
1982	1,992	-	388	316	2.9	2.4
1983	2,757	866	393	264	2.7	4
1984	7,754	2,667	461	279	2.4	3.2
1985	7,754	1,764	857	599	9.5	6.3
1986	4,999	1,982	1,586	1,430	30.5	9.3
1987	3,939	1,375	1,218	1,183	26.5	13.5
1988	3,737	1,323	814	878	19.7	29.7
1989	4,532	1,837	1,013	1,011	34.9	34.2
1990	12,680	3,937	1,676	1,647	44.6	39.9
1991	3,785	1,120	2,088	1,843	57.8	42
1992	10,533	4,163	1,954	1,948	52.2	58
1993	12,318	2,720	1,753	1,622	51.57	50.57
1994	8,106	1,803	2,339	1,661	50.95	66.5
1995	5,822	134	2,407	1,237	44.52	49.8
1996	2,176	378	486	450	20.91	18.78
1997	3,797	576	340	293	14.08	9.08
1998	4,284	632	315	381	23.82	13.5
1999	6,694	952	484	405	13.04	12.24
2000	3,674	671	433	256	7.36	9.03
2001	6,353	1,084	419	399	15.58	11.91
2002	12,338	2,542	567	562	30.62	20.86
***2003**	-	654	647	642	27.95	24.94
2004	-	-	-	12	3.25	7.94
2005	-	-	1.42	8	0.3	2.42
2006	-	-	0.33	0.83	0.042	0.37
2011	430	45	28.14	28.38	1.18	2.08
2012	2,990	517	260	239	23.2	24
2013	2,872	543	258	263	42.41	3.6
2014	5,315	1,034	426	401	66.98	51.5
2015	4,239	846	475	479	128.12	128.88
2016	458	75	103	109	46.72	49.77
2017	2,324	349	211	202	63.71	71.12
2018	3,899	681	443	435	12.168	117
2019	2,887	567	29	295	91.69	92
2020	3,304	661	422	424	123.4	117
2021	4,968	1,076	681	678	238.56	237.3
2022	3,212	694	414	408	*169.513	168.89
2023	181	36	44	47	*82.02	23.38

*2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ආධාර ක්‍රමය ක්‍රියාත්මක නොවිය.

* 2022 වර්ෂයේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘතීන් හි වියදම ද ඇතුළත්ව ප්‍රගතිය දක්වා ඇත.

* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.



3.3 හෝග පුනරුත්ථාපනය

ඒකක ඵලදායීතාවය වර්ධනය කිරීම අරමුණුකර දළු නෙලන රිකිලි තේ ඉඩම්වල නිර්දේශිත කප්පාදුව කිරීමෙන් පාළු සම්පූර්ණ කිරීම, පස සංරක්ෂණ ක්‍රම (කාණු පද්ධති /ගල් වැටි පිළිසකර කිරීම) හා සෙවන පාලනය කිරීම ඇතුළු අනෙකුත් වගා පිළිවෙත් ඒකාබද්ධව සිදුකිරීම (කප්පාදුව, වල්පැළ නෙලීම) වෙනුවෙන් හෝග පුනරුත්ථාපනය යටතේ දිරි දීමනා ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂ 10 ක කාලයක් තුළ සාර්ථක ලෙස තේ වගාව පවත්වාගෙන යාහැකි ඉඩම් මෙම ක්‍රමය සඳහා නිර්දේශ කරනු ලබන අතර, තේ ඉඩම් කප්පාදු අවස්ථාවට එළඹ තිබීම හෝ වගාවේ වයස අවුරුදු 04 ඉක්මවා තිබීම, ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් වේ.

මෙම ක්‍රමය යටතේ, තැනින් තැන ඒකරාශී වූ හෝ විසිරී තනි තනිව පවතින පාළු සහයා දළු නෙලන තේ වගාව පුනරුත්ථාපනය කිරීමේ පදනම මත අක්කරයකට පැළ 1,000 ක උපරිමයකට යටත්ව වාරික 2 කදී ආධාර ගෙවීම කරනු ලැබේ.

2019.01.01 දිනට පසුව නිකුත්කරන අවසරපත්‍ර සඳහා පමණක් පාළු පැළයක් සඳහා පළමු වාරිකය රුපියල් 75.00 ක් දක්වා වැඩිකර තේ ඉඩම් හිමියෙකුට වසරකට දැනට දෙන උපරිම බිම් ප්‍රමාණය අක්කර 01 (හෙක්ටයාර 0.4047) සිට අක්කර 02 (හෙක්ටයාර 0.8094) දක්වා වැඩි කර ඇත.

මෙම හෝග පුනරුත්ථාපන ක්‍රමය යටතේ ආධාර ලබාගැනීමට පාළු පැළ සිටුවන ස්ථානයේ "මානා" තෘණ අවම වශයෙන් වසර 1 1/2 ක් නඩත්තුකර තිබීම හෝ පැළ සිටුවන අවස්ථාවේදී එක් වලකට කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 02 ක් යෙදීම නිර්දේශකර ඇත. එමෙන්ම ඉදිරි වසර හතරක් (04) ක් ගතවනතුරු නැවත ආධාර ඉල්ලුම් කළ නොහැකිය.

සංඛ්‍යා සටහන් අංක - 14

භෝග පුනරුත්ථාපනය - 2022/2023 වර්ෂයේ භෞතික කාර්යඵලය (හෙක්ටයාර)


අංකය	කාර්යය	වර්ෂය	පහතරට බිම්					උඩරට හා මැදරට බිම්			එකතුව	ඉලක්ක	පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය
			ගාල්ල	කළුතර	මාතර	රත්නපුර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	ඌව			
1	ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව	2022	1,071	344	1,148	859	636	1,033	765	1,075	6,931	13,169	-16%
		2023	82	107	36	221	55	353	120	38	1,012	5000	-85%
2	නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව	2022	1,051	343	1,117	823	460	954	668	706	6,122	11,020	-19%
		2023	69	107	23	196	26	288	56	10	775	2,000	-87%
3	ඉලක්කගත පැළ සංඛ්‍යාව	2022	445,000	217,000	445,000	415,000	215,000	355,000	185,000	223,000	2,500,000	2,500,000	-17%
		2023	48,679	11,150	24,349	48,091	6,738	25,993	16,500	18,500	200,000	200,000	-92%
4	පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව	2022	409,281	145,317	440,732	432,480	184,498	395,918	170,299	252,741	2,431,266	2,500,000	-27%
		2023	48,589	11,315	24,609	49,441	8,621	28,985	16,906	18,145	206,611	200,000	-92%
5	දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව	2022	525,891	122,354	474,866	452,243	148,612	469,914	176,909	296,677	2,667,466	3,000,000	42%
		2023	159,781	38,788	122,992	115,940	43,604	101,812	31,244	44,525	658,686	320,000	-75%
6	ගෙවන ලද ආධාර මුදල (රුපියල් මිලියන)	*2022	37.76	14.9	44.58	43.73	17.58	48.18	17.96	26.64	251.33	337.5	-16.75%
		*2023	19.74	6.74	23.05	24.83	4.36	13.98	9.48	9.20	111.38	23.00	-56%

*2022 වර්ෂයේ භෝග පුනරුත්ථාපනය යටතේ අදියර I අයවැය කථාව මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතීන් හි වියදම් ද ඇතුළත් වේ.

* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.

ප්‍රස්තාර සටහන් අංක - 09



මූලාශ්‍රය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

කාර්යඵලය


2023 වර්ෂයේ භෝග පුනරුත්ථාපනය සඳහා 1,012 ක් දෙනෙකු අයදුම්කර තිබුණි. මෙම ප්‍රමාණයෙන් 775 දෙනෙකු සඳහා අවසරපත්‍ර නිකුත් කරනලදී. 2022 වසරට සාපේක්ෂව ඉල්ලුම්පත්‍ර ලද සංඛ්‍යාව 85% කින් අඩු වී ඇති අතර නිකුත්කරනු ලැබූ අවසරපත්‍ර සංඛ්‍යාව 87% කින්ද අඩු වී තිබුණි.

වර්ෂය තුළ පළමු වාරිකය ගෙවනු ලැබූ පැළ සංඛ්‍යාව 206,611 කි. මෙය ඉලක්කගත පැළ සංඛ්‍යාව වූ පැළ 200,000 න් 103% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව 92% කින් අඩු වී තිබේ. දෙවන වාරිකය වන වසරකට පසු නඩත්තුවෙහි ඉලක්කගත පැළ සංඛ්‍යාව 320,000 කි. එහි ප්‍රගතිය පැළ 658,686 ක් වන අතර එය ඉලක්කගත ප්‍රමාණයට සාපේක්ෂව 205% ක ප්‍රගතියකි.

පෙර වර්ෂයට සාපේක්ෂව දෙවන වාරිකය වෙනුවෙන් ගෙවූ පැළ සංඛ්‍යාව 75.3% කින් අඩු වී ඇත.

2023 වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 111.38 ක් ගෙවා ඇත. මෙහි ගෙවීම් විස්තර සංඛ්‍යා සටහන් අංක 14 මඟින් ද කාර්යඵලයට අදාළ විස්තර ප්‍රස්තාර සටහන් අංක 10 මඟින් දැක්වේ.

ප්‍රස්තාර සටහන් අංක 10



මූලාශය -කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

සංඛ්‍යා සටහන් අංක - 15

භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමයෙහි ක්‍රියාකාරිත්වය 1988-2023

වර්ෂය	අවසර පත්‍ර නිකුත් කර ඇති පැළ ගණන	පළමු වාරිකය ගෙවන ලද පැළ ගණන	දෙවන වාරිකය ගෙවන ලද පැළ ගණන	ගෙවන ලද මුලු ආධාර මුදල (රුපියල් මිලියන)	වාර්ෂික ප්‍රතිපාදන (රුපියල් මිලියන)
1988	5,121,825	3,861,892	2,496,705	10	19.37
1989	3,903,899	4,257,670	3,377,046	13.3	19.6
1990	3,847,466	2,986,998	2,975,849	9.32	7.2
1991		1,029,987	3,528,586	8.95	9.04
1992		235,404	1,148,371	2.49	5
1993		6,607	1,658	0.3	
1994		16,432	46,030	0.12	
1995		20,298	7,073	0.46	2.45
***1996**		13,278	3,181	1.19	15.2
****1996**	5,600,900	3,867,981			
****1997**	6,965,923	5,301,839		9.03	12
1998		1,707,845		4.14	15.02
***1999**			14,012	8.2	11.16
****1999**	617,120	2,454,895	1,846,445		
2000	2,713,972	812,174	389,248	3.68	11.54
2001	1,412,860	1,078,708	209,534	5.68	11.54
2002	4,031,727	2,522,872	486,948	11.22	10.38
2003	3,012,892	1,636,901	380,013	9.38	12
2004	2,303,061	1,489,167	593,906	14.46	12.99
2005	1,566,327	1,242,648	776,661	8.11	12.37
2006	972,913	520,610	540,819	7.79	8.58
2007	1,092,856	516,471	308,325	4.13	6
2008	836,729	519,607	404,331	4.84	3
2009	995,822	431,699	232,217	3.25	3.59
2010	769,104	424,227	254,715	3.58	5
2011	1,379,734	504,322	182,401	6.32	9.24
2012	1,902,051	766,991	345,152	14.35	8.66
2013	1,060,634	497,592	420,611	11.24	6
2014	776,271	271,015	232,034	5.91	17.5
2015	754,170	308,950	199,923	6.43	6
2016	981,075	367,876	246,339	7.8	10.48
2017	1,290,408	564,145	297,068	11.7	17.29
2018	1,648,390	797,530	442,296	15.69	2
2019	4,699,796	1,921,568	465,084	138.99	190.09
2020	4,000,609	2,137,450	1,605,865	187.86	190.59
2021	4,737,358	3,324,024	1,876,058	293.47	275
2022	3,341,919	2,431,266	2,667,466	*251.364	337.5
2023	466,338	206,611	658,686	*111.38	23.00

** සමිති මඟින් පාළු සැපයීමේ ක්‍රමය

*2022 වර්ෂයේ භෝග පුනරුත්ථාපනය යටතේ අදියර I අයවැය කථාව මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතීන් හි වියදම් ද ඇතුළත් වේ.

* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

3.4 කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වය


ප්‍රජා මූල සංවිධාන 50% කින් ඉහළ නැංවීම

"වසර 03 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම"

1989 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රමය නීතිගත සංවිධාන බවට පත්කිරීම සඳහා 1991 අංක 36 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනතෙහි 15 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඔ ඕ) ඡේදය යටතේ පැවරී ඇති බලතල අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අංක 878/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් 1995 අංක 01 දරණ කුඩා තේ වතු සංවර්ධන සමිති රීති ප්‍රකාශයට පත්කර තිබේ.

දිස්ත්‍රික් සංවිධාන 08 කින් සහ සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතුව පොදු ව්‍යවස්ථා මාලාවක් යටතේ සමිති පද්ධතිය ක්‍රියාත්මක වේ. 2022 වසර අවසානය වනවිට කුඩා තේ වතු සංවර්ධන සමිති, 1,484 ක් ලියාපදිංචිවී තිබූ අතර, එයට අයත් සාමාජිකයන් සංඛ්‍යාව 305,736 ක් වේ. ඒ අනුව 2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේ සාමාජිකයන් සංඛ්‍යාව 1.64% කින් අඩු වී තිබුණි.

ප්‍රස්තාර සටහන් අංක 11



මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී ගාල්ල සමිති 2 ක් ද කළුතර සමිති 3 ක්ද කෑගල්ල සමිති 2 ක් ද ඌව සමිති 1 ක් ද වශයෙන් සියළුම සමිති 08 ක් අලුතෙන් ලියාපදිංචි කර ඇත. කුඩා තේ වතු සංවර්ධන සමිති වඩාත් සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදීම සඳහා 2023 වසරේදී සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණයවන පරිදි විවිධ වැඩසටහන් 26 ක් ඉලක්කය වශයෙන් සැලසුම් කර එයින් වැඩසටහන් 11 ක් සම්පූර්ණ කර ඇත. සමස්ත වශයෙන් ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත්කිරීම සඳහා ආයතනය විසින් රුපියල් මිලියන 1.39 ක් 2023 වසරේ වැයකර තිබුණි.

සංඛ්‍යා සටහන් අංක - 16

කුඩා තේ වතු සංවර්ධන සමිති ව්‍යාප්තිය

ප්‍රාදේශීය කාර්යාලය	සමිති සංඛ්‍යාව		සාමාජිකයන් සංඛ්‍යාව	
	2022	2023	2022	2023
ගාල්ල	217	219	49,230	43,714
මාතර සහ හම්බන්තොට	192	192	53,978	54,263
කළුතර	116	119	23,217	23,464
කෑගල්ල	148	150	28,903	29,589
මහනුවර සහ මාතලේ	227	227	22,231	22,306
නුවරඑළිය	127	127	14,837	14,137
රත්නපුරය	291	291	88,893	88,893
ඌව (බදුල්ල සහ මොණරාගල)	166	167	24,447	24,340
එකතුව	**1,484**	**1,492**	**305,736**	**300,706**

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

3.5 විශේෂ ව්‍යාපෘති (සංවර්ධන)

3.5.1 කුඩා තේවතු හිමියන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ලංකා බැංකුව සමග එක්ව කුඩා තේවතු හිමියන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, කුඩා තේ වතු හිමියන් ඉතිරි කිරීම් සඳහා දිරි ගැන්වීම තුලින් ආයෝජන සඳහා දිරිමත් කරවීමට මෙම වැඩසටහන දියත් කර ඇත.

ඒ අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල 08 කේන්ද්‍ර කර ගනිමින්, 2023 දෙසැම්බර් මස 02 දින මෙම වැඩසටහන දිවයින පුරා දියත් කරන ලද අතර එම දිස්ත්‍රික්ක වල ලංකා බැංකු ශාඛාවන්හි නියෝජිතයින්, කුඩා තේ වතු සමිති සාමාජිකයින් සඳහා බැංකු ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. මෙම බැංකු ගිණුම් වල විශේෂත්වය වන්නේ එහි කුඩා තේ වතු හිමියන්ගේ දළු පොත් අංකය, බැංකු ගිණුමේ ඇතුළත් කර තිබීමයි. එමඟින් ඉදිරියේදී කුඩා තේ වතු හිමියන් වෙත බැංකුවෙන් ලබා දෙන විශේෂ වරප්‍රසාද සඳහා ඉදිරිපත් වීමට හැකියාව ලැබෙනු ඇත.

සංඛ්‍යා සටහන් අංක - 17

කුඩා තේවතු හිමියන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය 2023.12.31 දිනට

ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන් පැවැත්වූ ස්ථානය	සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ආරම්භ කරන ලද ගිණුම් සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	
				TSHDA	BOC
කළුතර	ජගත් උත්සව ශාලාව - බදුරලිය	101	.	10	26
මහනුවර	මැණික්දිවෙල තේ කම්හල	72	45	6	6
මාතර	පිටබැද්දර සුමින්දාරාම විහාරය	357	40	7	25
නුවරඑළිය	හෙල්සිරිගම ශ්‍රී ගුණරතන විහාරස්ථානය - මාවෙල	54	45	6	6
ඌව	හාලිඇල	278	165	5	15
	වැලිමඩ	114	25	3	3
	බණ්ඩාරවෙල	109	86	4	6
කෑගල්ල	රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය	562	268	16	12
රත්නපුර	සන්නස්ගම ව්‍යාජ්ති මධ්‍යස්ථානය	82	48	8	6
ගාල්ල	නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	200	54	10	25
එකතුව		**1929**	**776**	**75**	**130**





3.5.2 සෘජු තේ වගාව (රුපියල් මිලියන 750)

තේ වගාවේ නැවත වගා කිරීමේ ක්‍රියාවලියේ ඇති අඩුපාඩු මගහරවා ගැනීම ඉලක්ක කර ගනිමින් තේ පර්යේෂණායතනයේ නිර්දේශ වලට අනුකූල වනසේ සෘජු තේ වගා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඒ අනුව කොම්පෝස්ට් යොදා, ඒ මත සෘජුව තේ පැළ සිටුවීම සඳහා තේ වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක 08 ආවරණය කරමින් හෙක්ටයාර 750 ක භූමි ප්‍රමාණයක් සෘජු තේ වගා කිරීමට සැලසුම් කරන ලදි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් පුහුණු කර ඇති යාන්ත්‍රික ශ්‍රම බලකාය මඟින් වලවල් හැරීම ද, පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොම්පෝස්ට් නිෂ්පාදන ආයතන මඟින් ලංසු කැඳවා කොම්පෝස්ට් මිලදී ගැනීම ද, අධිකාරියේ ලියාපදිංචි තේ පැළ තවාන් මඟින් තේ පැළ මිලදී ගැනීමද සිදුකරන ලදි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් තේ ඉඩම් වල ඵලදායීතාවය වැඩි කිරීම මඟින් තේ වගා කරුවන්ගේ ආදායම ඉහළ නැංවීමටත්, තේ වගාකරුවන් යහපත් කෘෂිකාර්මික පුරුදු භාවිතයට හුරු කිරීමත් අපේක්ෂා කරන අතර මෙම ව්‍යාපෘතියේ 2023.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංඛ්‍යා සටහන් අංක 19 මඟින් දැක්වේ.

සංඛ්‍යා සටහන් අංක - 18

සෘජු තේ වගා (රුපියල් මිලියන 750) ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව

ක්‍රියාකාරකම	ව්‍යාපෘතිය සඳහා වන මුළු වියදම (රු.මි.)
i. භූමිය පිළියෙල කිරීම (වලවල් හැරීම)	187.50
ii. කොම්පෝස්ට්යෙදීම (එක් වලක් සඳහා කිලෝග්‍රෑම් 01)	187.50
iii. තේ පැළ සඳහා	375.00
එකතුව	**750.00**







සංඛ්‍යා සටහන් අංක - 19

සෘජු තේ වගා (රුපියල් මිලියන 750) ව්‍යාපෘතියෙහි 2023.12.31 දිනට ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය		ඉල්ලුම් පත්‍ර ලැබීම		අවසර පත්‍ර නිකුත් කිරීම		වලවල් හැරීම (බිම් සැකසීම)							කොම්පෝස්ට් යෙදීම					පැළ සිටුවීම				
		ගණන	හෙක් ගණන	ගණන	හෙක් ගණන	ඉලක්කය (හෙක්)	ප්‍රගතිය (හෙක්)	(%)	ඉලක්කය (වලවල් ගණන)	ප්‍රගතිය (වලවල් ගණන)	මූල්‍ය ඉලක්කය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ඉලක්කය (කි.ග්‍රෑ)	ප්‍රගතිය (හෙක්)	ප්‍රගතිය (කි.ග්‍රෑ)	මූල්‍ය ඉලක්කය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ඉලක්කය (පැළ ගණන)	ප්‍රගතිය (හෙක්)	ප්‍රගතිය (පැළ ගණන)	මූල්‍ය ඉලක්කය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)
1	ගාල්ල	2383	392.73	2352	371.75	205.5	102.90	50%	2,568,750	1,266,249	51.38	25.32	2,568,750	1,362	1,549,056	51.38	27.24	2568750	45.19	543999	89.91	19.04
ගෙවීම >>>							13.29	6%		154,138		3.08		7.62	98,640		1.97		7.11	85999		3.01
2	මාතර	1581	312.18	1565	271.94	146.0	190.04	130%	1,825,000	2,335,452	36.50	46.71	1,825,000	1,224	1,223,510	36.50	24.47	1825000	52.24	648480	63.88	22.70
ගෙවීම >>>							89.15	61%		1,092,777		21.86		-			-		-	-		-
3	රත්නපුර	1051	301.84	979	252.67	148.0	184.36	125%	1,850,000	2,280,564	37.00	45.61	1,850,000	1,203	1,202,846	37.00	24.06	1850000	35.08	431810	64.75	15.11
ගෙවීම >>>							113.35	77%		1,400,271		28.01		-			-		1.00	12500		0.44
4	මහනුවර	404	108.59	373	81.53	47.0	53.59	114%	587,500	663,471	11.75	13.27	587,500	390	481,000	11.75	7.80	587500	54.67	659827	20.56	23.09
ගෙවීම >>>							30.89	66%		382,839		7.66		3.79	46,912		0.94		16.17	192705		6.74
5	නුවරඑළිය	300	119.47	207	42.34	21.0	20.54	98%	262,500	248,404	5.25	4.97	262,500	132	248,410	5.25	2.63	262500	12.88	155886	9.19	5.46
ගෙවීම >>>							2.86	14%		34,779		0.70		0.79	9,050		0.18		0.92	11150		0.39
6	ඌව	460	200.42	357	64.84	45.0	47.23	105%	562,500	574,284	11.25	11.49	562,500	598	597,500	11.25	11.95	562500	47.05	565742	19.69	19.80
ගෙවීම >>>							11.58	26%		134,901		2.70		-			-		-	-		-
7	කළුතර	463	115.54	447	105.40	65.0	55.02	85%	812,500	678,871	16.25	13.58	812,500	410	410,000	16.25	8.20	812500	18.37	226969	28.44	7.94
ගෙවීම >>>							17.52	27%		216,301		4.33		-			-		-	-		-
8	කෑගල්ල	705	172.42	568	114.24	65.0	89.07	137%	812,500	1,110,827	16.25	22.22	812,500	510	678,000	16.25	10.20	812500	43.39	533901	28.44	18.69
ගෙවීම >>>							40.96	63%		510,184		10.20		-			-		1.59	16525		0.58
එකතුව		**7347**	**1723.2**	**6848**	**1304.71**	**742.50**	**742.75**	**100.0%**	**9,281,250**	**9,158,122**	**185.63**	**183.17**	**9,281,250**	**5,829**	**6,390,322**	**185.63**	**116.55**	**9,281,250**	**308.87**	**3,766,614**	**324.86**	**131.83**
ගෙවීම >>>							**319.60**	**43.0%**		**3,926,190**		**78.52**		**12.20**	**154,602**		**3.09**		**26.78**	**318879**		**11.16**

